06

# අන් නජාසත් (අපිරිසිදුකම)

මුස්ලිම් බැතිමතෙකු ඉබාදත් ඉටු කිරීමට පිරිසිදු ව සිටීමේ අවශ්‍යතාව පිළිබඳ ව පෙර පාඩමෙහි දී අපි ඉගෙන ගත්තෙමු. මුස්ලිම් බැතිමතෙක් සෑම විට ම පිරිසිදු ව හා නිරෝගී ව සිටීමටනම් ඔහු නජීස්වලින් (අපිරිසිදුකමින්) වැළකි ජීවත් වීම අත්‍යවශ්‍ය ය. අරාබි භාෂාව තුළ "අන් නජාසත්" යන වචනය අපිරිසිදුකම යන අර්ථයෙන් භාවිත කරනු ලැබේ. මෙවැනි අපිරිසිදුකම්, ඒවායේ වර්ග හා ඉන් පිරිසිදු වන ක්‍රම පිළිබඳ ව ඉස්ලාම් අපට පැහැදලි ව පවසා ඇත. මෙම පාඩමෙන් නජීස් පිළිබඳ ව දැන ගනිමු.

## නජීස් වර්ග

නජීස් පිරිසිදු කරන ක්‍රමය සැලකිල්ලට ගෙන එය කොටස් තුනකට බෙදා දක්වා ඇත.

1. සමාන්‍ය නජීස්
2. මෘදු නජීස්
3. දැඩි නජීස්



## 1. සාමාන්‍ය නජීස් හි අඩංගු වන දේවල්

- ★ මලපහ
- ★ මුත්‍ර
- ★ රුධිර
- ★ සැරව
- ★ වමනය
- ★ මදි
- ★ වදි
- ★ මත්පැන්
- ★ තද නින්දේ දී මුවින් පිටවන කෙළ
- ★ අනුභව කිරීමට අනුමැතිය නොලත් සතුන්ගේ කිරි
- ★ සතුන්ගේ මළ කුණු
- ★ ජීවත්ව සිටින ප්‍රාණීන්ගෙන් වෙන් වූ කොටස්

පහත සඳහන් දෑ සාමාන්‍ය නජීස් තත්ත්වයෙන් මිදේ.

* ස්වාභාවික ව මිය ගිය මසුන්, පළගැටියා
  (මේවා අනුභව කිරීමට අනුමත කර ඇත.)

* රුධිර සංසරණයක් නොමැති කුහුඹුවන්, මී මැස්සා යනාදිය

* අනුභව කිරීමට අනුමැතිය ඇති මිය ගිය සතුන්ගේ අස්ථි, අං, නිය, රෝම, පිහාටු යනාදිය.

* ඉතා ම ස්වල්ප වශයෙන් ඇඳුමෙහි, හෝ ශරීරයෙහි හෝ තැවරුණු රුධිරය

* මවු කිරි

**පිරිසිදු කරන ආකාරය.**

ඉහත සඳහන් කරන ලද නජීස් ශරීරයේ හෝ ඇඳුමෙහි හෝ තැවරුණු විට පළමු ව ම එම නජීසය එම ස්ථානයෙන් ඉවත් කළ යුතු ය. පසු ව නජීසයේ රසය, වර්ණය, සුවඳ යන ගුණාංග තුන ම ඉවත් වන තුරු සේදිය යුතු ය. ජලය පමණක් භාවිත කොට නජීසය ඉවත් කළ නොහැකි නම් සබන්, සබන් කුඩු, යනාදිය භාවිත කළ යුතු ය. පිරිසිදු කළ පසු ව ද එම නජීසයේ වර්ණය, සුවඳ යන දෙක ම හෝ නැතහොත් රසය පමණක් ඉතිරි ව ඇත්නම් එය පිරිසිදු යැයි සලකනු නොලැබේ.



## 02. මෘදු නජීස්හි අඩංගු වන දේවල්

මවු කිරි පමණක් ආහාර ලෙස ගනු ලබන වයස අවුරුදු දෙකට අඩු පිරිමි දරුවකුගේ මුත්‍රා.

**පිරිසිදු කරන ආකාරය**

මෙම නජීසය පිරිසිදු කරන විට නිශ්චිත ස්ථානය මිරිකා නජීසය ඉවත් කිරීමෙන් පසු ව, එම ස්ථානයෙහි ඉතා පිරිසිදු ජලය අවශ්‍ය තරම් ඉසීම පමණක් ප්‍රමාණවත් ය.

## 03 'දෘඩි නජීස්හි' අඩංගු වන දේවල්

බල්ලා, ඌරා, යන සතුන්ගේ මල පහ, සැරව, කෙළ, දහඩිය, රුධිරය වැනි සියල්ල ම මෙම ගණයට ඇතුළත් වේ.

**පිරිසිදු කරන ආකාරය**

මෙම නජීසය පිරිසිදු කරන විට ඉහත පවසන ලද ක්‍රමය අනුගමනය කිරීමත් සමග තව දුරටත් පස් මිශ්‍ර ජලය භාවිත කිරීමත් සත් වතාවක් ජලය වත් කර සේදීමත් අනිවාර්ය වේ. ප්‍රථමයෙන් ම හෝ අතර මග දී පස් ද්‍රාවණය භාවිත කළ හැකි ය. දෘඩි නජීස් තැවරුණු ස්ථානයෙහි නජීසයෙහි මූලික ගුණාංග තුන නොපෙනුණ ද එම ස්ථානය සත් වරක් සේදිය යුතු ය.

විහිදී පවතින (මුහුද, වැව වැනි) අධික ව ජලය රැඳෙන ස්ථානවල පිරිසිදු කරන විට හා ගංගා වැනි ගලා යන ජලයෙහි පිරිසිදු කරන විට ජලය සුළු වශයෙන් කලතා එම ජලය තුළට සය වරක් දියේ ගිලීම ගැනීම ප්‍රමාණවත් වේ.

## නජීස් දේවල් පිරිසිදු කරන ආකාරය

පොදුවේ ගත් කල, නජීස් දේ පිරිසිදු කළ නොහැකි ය. නමුත්, නජීස් වන ද්‍රව්‍ය කිහිපයක් භාවිත කළ හැකිය. ඒවාට උදාහරණ ලෙස පහත සඳහන් දේ දැක්විය හැකි ය.

*** සතුන්ගේ සම්**

බල්ලා, ඌරා හැර අනෙකුත් සතුන්ගේ සම් ගත් කල හොඳින් පදම් කර ගැනීම තුළින් අහාරයට ගැනීම හැර, වෙනත් අවශ්‍යතා සඳහා භාවිත කළ හැකි ය.

*** මත්පැන් (රා)**

ස්වාභාවික ව ගන්නා ලද බාහිර ද්‍රව්‍ය මිශ්‍ර නොකරන ලද රා, ස්වාභාවයෙන් ම විනාකිරි බවට පත් වන්නේ නම්, එය ආහාර සඳහා භාවිත කළ හැකි ය.

*** නජීස් තැවරුණ කැටි වූ කිරි**

මුදවන ලද කිරි, එළඟි තෙල්, බටර්, චීස් වැනි කැටි වූ තත්ත්වයෙහි ඇති කිරි මත නජීසයක් පතිත වූයේ නම් එම නජීසය තැවරුණු කොටස ඉවත් කර ඉතිරිය භාවිත කළ හැකි ය.

**අභ්‍යාස**

01. 'නජීස්හි' ප්‍රධාන වර්ග උදාහරණ සමග ලියන්න.

02. යමකුගේ වස්ත්‍රයෙහි දැඩි නජීස් තැවරුණු විට එය ඉවත් කර ගැනීමට කුමක් කළ යුතු ද?

03. අනුභවය ට තහනම් කරන ලද බල්ලා-ඌරා හැර අනෙකුත් සතුන්ගේ සම් පිරිසිදු කිරීමට කුමක් කළ යුතු ද?

04. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඉස්ලාමීය නීති රීති සොයා ලියන්න.
    01. මියගිය ගවයකුගේ සමෙන් බෙර සෑදීම.
    02. මදුරුවකුට ගසන විට ශරීරයේ රුධිරය තැවරීම
    03. මුදවපු මී කිරි බඳුනකට නජීසයක් පතිත වීම.
    04. ස්වාභාවිකව මිය ගිය, නරක් නොවූ තත්ත්වයෙහි තිබෙන පළගැටියකු ආහාරයට ගැනීම.